# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 / 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 2005 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 22/07/2024 පැය 0750

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.07.21 වන දින සවස් කාලයේ කොට්ටාව පොලිස් වසමේ ගලවිලපුර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 60 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවකු සහ සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.07.21 වන දින දහවල් කාලයේ බොරැල්ල පොලිස් වසමේ කිතුල්වත්ත පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 26 මිලිග්‍රෑම් 970 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු සහ හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන අතර සැකකාරිය වයස අවුරුදු 47 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.07.21 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්වෙස් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක්

මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 810 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හදිසි ගින්නක් - මහඔය පොලිස් වසම.

2024.07.21 වන දින දහවල් කාලයේ මහඔය පොලිස් වසමේ මාදුරුඔය රක්ෂිතයේ හදිසි ගින්නක් හටගෙන ඇති බවට මහඔය පොලිසියට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්, යුධ හමුදා නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් සහාය ඇතිව ගින්න මැඩපවත්වා ඇත.

ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර, ගින්නෙන් අක්කර 25 ක පමණ භූමියක් විනාශ වී ඇත. ගින්න හේතුවෙන් ජීවිත හානි සිදුව නොමැත. මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**